**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර - 2 - 2019**

**-----------------------------------------------------------------------**

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අධියර 2 හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2016 මාර්තු 17 දින එලඹි අංක එස්.එල්-පී 115 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති සංදේශයේ 18 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුල ජල සැපයුම් පද්ධතියක් ඉදිකිරීම තුලින් ආරක්ෂිත පානීය ජලය සැපයීම හා ජල සම්පාදන ආවරණ ප්‍රදේශය වැඩි කිරීමත්, එමඟින් ව්‍යාපෘති ප්‍රදේශයේ සෞඛ්‍ය තත්වය හා ජීවන පරිසරය වැඩි දියුණු කිරීම් වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 31,598 කට සමාන ජපාන යෙන් මිලියන 27,301 ක් විය. ඉන් රු.මිලියන 26,779 කට සමාන ජපාන යෙන් මිලියන 23,137 ක් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් මූල්‍යානය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 4,819 කට සමාන ජපාන යෙන් මිලියන 4,164 ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘති අදියර II යටතේ වූ ක්‍රියාකාරකම් 2017 ජූනි මාසයේදී ආරම්භ කර තිබූ අතර 2024 මාර්තු වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්වාගනනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණු වල බලපෑම හැර ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මේ සමඟ වූ මූල්‍ය ප්‍රකාශයන් මඟින් මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශණ පිලියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ තාත්වික විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමණාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය විසින් වාර්ශිකව හා කාලීනව මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘතියේ සියළුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්ථා පවත්වා ගැනීම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | බලපෑම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ----------------------- | -------------- | ----------- | ------------------------------------ | -------------- |
| සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මහ බැංකුවේ 2019 දෙසැම්බර් 31 දක්වා නඩත්තු කරන ලද විශේෂ යෙන් ගිණුම හරහා විදේශ මුදල් හුවමාරුව සඳහා ලැබී ඇති රු.මිලියන 1.25 ක විනිමය ලාභය කෙරීගෙන යන වැඩ ගිණුම තුළ වැරදියට පෙන්වා තිබීම. | 1.25 | කෙරීගෙන යන වැඩ ගිණුම වැඩියෙන් දැක්වීම සහ වත්කම් ගිණුම අඩුවෙන් දැක්වීම. | සාමාන්‍යයෙන් පසුගිය වසරේදී යෙන් වටිනාකම අඛණ්ඩව අගය කරන ලදී. එබැවින් අදියර 2 හි මහබැංකු යෙන් ගිණුමේ සමුච්චිත ශේෂයක් පවතී. මහ බැංකුවෙන් මෙම ගිණුම් ශේෂ තොරතුරු ඉල්ලා සිටි නමුත් ලැබුණේ නැත. (එහි පිටපතක් මේ සමඟ අමුණා ඇති අතර ඉල්ලුම් කළ විට පිටපත් රජයේ විගණන අංශයට යැවිය හැක ) මහබැංකුව ධනාත්මක ශේෂය ව්‍යාපෘතියට නිදහස් කලේ නැත. (දේශීය බිල් ගෙවීම් සම්බන්ධ) එමනිසා, වර්තමාන පරිචය හා මගපෙන්වීම් වලට අනුව මෙම ශේෂයන් කෙරීගෙන යන වැඩ ගිණුමට ගන්නා ලදී. | විනිමය ලාභය වත්කමක් ලෙස ගිණුම් ගත කිරීමට පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්ය සාධානය

### 3.1 ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය

අනාරක්ෂිත හා දූෂිත භූගත ජලය මත යැපෙන මිනිසුන් වෙසෙන කැබතිගොල්ලැව, පදවිය, හොරොව්පතාන හා කහටගස්දිගිලිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ අනුරාධපුර උතුර ජලසම්පාදන ව්‍යාපෘතිය අදියර 2 ක්‍රියාත්මක වේ. එබැවින් අවම කාලයකින් හා ප්‍රමාදයකින් තොරව මෙම ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රමුඛතාවය දී තිබේ. මූලික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව ව්‍යාපෘති අධියර 2, 2016 ජනවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර 2021 ජනවාරි වන විට වසර 05 ක් තුළ නිමකිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත් ජල මූලාශ්‍ර වෙනස්වීම හේතුවෙන් 2020 අගෝස්තු 31 වන විට ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට මාස 38 ක් ගතවී තිබුනද ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම් පමණක් සම්පූර්ණ කර තිබුණි. එබැවින් 2019 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන නොමැත. මන්දගාමී ප්‍රගතියේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය 2024 මැයි දක්වා සංසෝදනය කර තිබුණි.

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකයන් | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන සහකාර සඳහා වන උපදේශණ කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 26 දින ප්‍රදානය කරන ලද අතර 2020 පෙබරවාරි 20 වන විට අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් 2020 අගෝස්තු 31 වන විට ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම් කිරීම පමණක් අවසන් කර තිබුණි. ප්‍රසම්පාදන සහකාර කටයුතු සඳහා වන උපදේශණ සේවාවේ කාල සීමාව 2021 අගෝස්තු 31 දක්වා දීර්ඝ කරගෙන තිබුණද උපදේශණ කොන්ත්‍රාත් ගිවිසුම 2020 පෙබරවාරි 20 දින සිට දීර්ඝ කර නොමැත. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය | උපදේශණ කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීම සඳහා වූ ඉල්ලීම සහ යෝජිත විචලතා නියෝගය විචලතා කමිටුවට ඉදිරිපත් කර ඇත. විචලතා නියෝග සම්බන්ධයෙන් උපදේශකගේ යම් මතබේදයක් හේතුවෙන් සාකච්ජා සිදුවෙමින් පවතී. විචලතා නියෝග අනුමත වූ පසු කාල දිගුව ලබා දෙනු ඇත. | ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සහය කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ii) | සවිස්තරාත්මක සැලසුම් කිරීම හා ප්‍රසම්පාදන සහාය ලබා ගැනීම සඳහා වන උපදේශණ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ලබාගත යුතු වෘත්තිය වගකීම් රක්ෂණය ව්‍යාපෘතියේ දෝෂ වගකීම් කාලය අවසන් වන තෙක් එනම් 2025 ජූනි දක්වා ආවරණය වන පරිදි ලබා ගැනීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අදාළ වෘත්තිය වගකීම් රක්ෂණය මඟින් ආවරණය වී ඇත්තේ 2020 සැප්තැම්බර් 01 සිට 2021 සැප්තැම්බර් 01 දක්වා වූ කාලයක් පමණි. | වෘත්තිය වගකීම් රක්ෂණය, 2025 ජූනි දක්වා වූ ව්‍යාපෘතියේ දෝෂ වගකීම් කාල සීමාව ආවරණය කර නොතිබුණි. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් වෘත්තිය වගකීම් රක්ෂණය 2025 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලෙස උපදේශකවරයාට උපදෙස් දී ඇත. | 2025 ජූනි දක්වා ව්‍යාපෘතියේ දෝෂ වගකීම් කාලය ආවරණය වන පරිදි වෘත්තිය වගකීම් රක්ෂණය ලබාගත යුතුය. |
| (iii) | ව්‍යාපෘතිය විසින් ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශන කොන්ත්‍රාත්තුව, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ආරම්භ කිරීමට පෙර ප්‍රදානය කළ යුතු වේ. කෙසේ වෙතත් ඉදිකිරීම් අධීක්ෂණ කොන්ත්‍රාත්තුව සඳහා වන අමාත්‍ය මණ්ඩලය පත්කළ උපදේශණ ප්‍රසම්පාදන කමිටුව පමණක් 2020 සැප්තැම්බර් 14 දින පත් කර ඇති අතර කෙටුම්පත් ලංසු ලේඛණ ඇගයීමට යවා ඇත. එබැවින් ව්‍යාපෘතියේ සංශෝධිත ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහනට | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශක බඳවා ගැනීම ප්‍රමාද වීම. | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශණ කොන්ත්‍රාත්තුව සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශණ ප්‍රසම්පාදන කමිටුව 2020 සැප්තැම්බර් 14 වන දින පත්කර තිබුණි. කෙටුම්පත් ලංසු ලේඛණ ඇගයීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කල උපදේශණ ප්‍රසම්පාදන කමිටුව | ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශක බඳවා ගැනීම තවදුරටත් ප්‍රමාදයකින් තොරව වේගවත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුව ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වන උපදේශක බඳවා ගැනීම 2021 ජුනි මාසය දක්වා ප්‍රමාද වී ඇත. | | වෙත යවා ඇත. නව වැඩසටහනට අනුව උපදේශණ කොන්ත්‍රාත්තුව 2021 ජූනි මාසයේ ප්‍රදානය කිරීමට නියමිතය. | |
| (iv) | ජල තුළුමුව පහසුකම්, ජල පවිත්‍රාගාරය, ජල ගබඩා ව්‍යුහයන්, යාන්ත්‍රික, විදුලි හා ගොඩනැගිලි වැඩ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවෙහි කැබලි අක්ෂර - අ (LOT A) හි පූර්ව සුදුසුකම් 2020 මැයි 27 දින කැඳවනු ලැබූ අතර 2020 සැප්තැම්බර් 15 වන දින අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් 2020 ඔක්තෝබර් 15 දින දක්වා ලංසු තැබීම සඳහා කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛණ පිළියෙළ කිරීම හා ඒවා තාක්ෂණික ඇගයීම් කමිටුවට ඉදිරිපත් කර නොමැති බවට නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය | කැබලි අක්ෂර 'අ' (LOT A) සඳහා වන කොන්ත්‍රාත්තුවේ පූර්ව සුදුසුකම් 2020 මැයි 27 වන දින කැඳවනු ලැබූ අතර අයදුම්කරුවන් විසින් මතුකරන ලද විමසීම් කිහිපයකින් පසුව 2020 සැප්තැම්බර් 15 දින ටෙන්ඩරය වසා දමන ලදී. කැබලි අක්ෂර 'අ' (LOT A) හි ටෙන්ඩර් ලේඛන 2020 ඔක්තෝබර් 31 වන දින තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ලේඛණ ඇගයීම් සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. | ප්‍රමාද නොවී තාක්ෂණික ඇගයීම සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |
| (v) | ව්‍යාපෘතිය මගින් ලබාදෙන ලද තොරතුරු අනුව මෘදු යකඩ (DI) හා අධි තාක්ෂණික පොලි එතලින් නල (HDPE) සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සැපයීම් හා ඇතිරීම් සම්බන්ධ කොන්ත්‍රාත්තුව - කැබලි අංක බී (LOT B) සඳහා පූර්ව සුදුසුකම් 2020 මැයි 27 දින කැඳවන ලදී. කෙසේ වෙතත් 2020 අගෝස්තු 31 දක්වා පූර්ව සුදුසුකම් ඇගයීම් සහ අනුමත කිරීම් අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය | කැබලි අංක බී (LOT B) සඳහා වන කොන්ත්‍රාත්තුවේ පූර්ව සුදුසුකම් 2020 මැයි 27 වන දින කැඳවනු ලැබූ අතර 2020 අගෝස්තු 11 දින අවසන් කරන ලදී. පූර්ව සුදුසුකම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය ලැබී ඇති අතර අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු රැස්වීම 2020 ඔක්තෝබර් 5 වන දින පවත්වන ලදී. කෙසේ වෙතත් වැඩිදුර පැහැදිලි කිරීම් අයදුම්කරුවන්ගෙන් ඉල්ලාසිටිය යුතු බව රැස්වීමේදී තීරණය විය. කැබලි අංක බී (LOT B) හි ලංසු ලේඛණ 2020 අගෝස්තු 31 වන දින තා.ඇ.ක වෙත ඉදිරිපත් කර ඇති අතර ඒවා දැනට ඇගයීම් අදියරේ පවතී. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (vi) | උපදේශණ කොන්ත්‍රාත්තුව මඟින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා රුපියල් මිලියන 4 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ අරමුණු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ අනාගතයේදී වගාවන්ට හා පානිය ජල අරමුණු අතර ජලය වෙන්කිරීම සම්බන්ධව ගොවියන්ගේ විරෝධතා වැළැක්වීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්විය යුතු වුවත්, උපදේශණ කොන්ත්‍රාත්තුව ආරම්භයේ සිට 2020 අගෝස්තු 31 වන දිනට මාස 28 ක් ඉක්මගියද, මහජනතාව දැනුවත්කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීමට ව්‍යාපෘතිය අපොහොසත් වී ඇත. | මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීම ප්‍රමාදවීම | ප්‍රසම්පාදන සහය කාලය තුල මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණය පැවැත්වීමට සැලසුම් කර ඇත. අනුරාධපුරයෙහි ස්ථානගතවීමට පෙර හා ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට පෙර දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධ යෝජනාව සංවිධානය කිරීම සඳහා කමිටුවක් පත්කරන ලදී. | සැලසුම්කර ඇති පරිදි මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීමට පියවර ගත යුතුය. |

**3.3 මතභේදයට තුඩු දෙන කරුණු**

| විගණන නිරීක්ෂණය<br>------------------------ | බලපෑම<br>------------- | කළමණාකරණයේ අදහස් දැක්වීම<br>------------ | විගණකගේ නිර්දේශය<br>------------------------ |
|---|---|---|---|
| 2018 ජූලි සිට 2020 ජූලි දක්වා මාස 24 ක කාලයක් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යාලය ඇතුළු උපදේශක කාර්යාල ගොඩනැගිල්ලේ කුලී ගාස්තු ලෙස රුපියල් මිලියන 9.6 ක් වෙන් කර ඇත. කෙසේ වෙතත්, කල්බදු ගිවිසුම 2020 ජූලි මස කල් ඉකුත් වී ඇති අතර එය 2021 ජූලි දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව ලේඛණගත කාල සීමාව තුළ උපදේශණ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම ප්‍රමාදවීම හේතුවෙන් කුලී ගාස්තු වශයෙන් මසකට රුපියල් 260,150 බැගින් රු.මිලියන 3.12 ක අතිරේක කුලී ගාස්තුවක් ගෙවීමට සිදුව ඇත. | උපදේශණ කොන්ත්‍රාත්තුවට ලබා දී ඇති දීර්ඝ කිරීම් කාලය හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් අමතර කුලී ගාස්තු ගෙවීමට සිදුවීම. | උපදේශණ කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීම නිසා අමතර කුලී ගාස්තු අය විය. උපදේශණ කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට හේතු 1.3 a වගන්තියෙන් පැහැදිලි කරන ලදී. | ලේඛණගත කාල සීමාව තුළ උපදේශණ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට උපදෙස් ලබාදීම සහ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් වැඩ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම . |